**කොලොන්න ප්‍රාදේශීය සභාව - 2022**

**-------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

කොලොන්න ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට කොලොන්න ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව

විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව  විගණනයේ කොටසක් ලෙස මා විසින්  විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන  ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

### 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | එකතුව රු.1,164,487ක් වූ යන්ත්‍ර උපකරණ, ලී බඩු හා සවිකිරීම් හා වාහන නැවැත්වීමේ අංගනයේ පිරිවැය ප්‍රාග්ධනිත කර නොතිබුණි. එමෙන්ම, කොම්පෝස්ට් අංගනය ඉදිකිරීමේ පිරිවැය රු.573,787ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | 2023 වර්ෂයේ ගිණුම සකස් කිරීමේදී නිවැරදි කරන බව. | වටිනාකම් නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කර්මාන්ත ණයහිමි ශේෂය රු.27,369,952ක් ද කර්මාන්ත ණයගැති ශේෂය රු.25,633,709ක් ද වැඩියෙන් දක්වා තිබුණි. | 2023 වර්ෂයේ ගිණුම් සකස් කිරීමේදී නිවැරදි කරන බව. | වටිනාකම් නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයට අදාළ හිහ දැන්වීම් පුවරු ගාස්තු රු.58,650ක් හා හිහ සම්ප්‍රේෂණ කුළුණු ආදායම් රු.12,000ක් ගිණුම්ගත කර නොතිබුණි. | 2023 වර්ෂයේ ගිණුම් සකස් කිරීමේදී නිවැරදි කරන බව. | වටිනාකම් නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ඈ) | සභා අරමුදලින් ගෙවන ලද දෛනික කම්කරු වැටුප් රු.110,889ක් ලැබිය යුතු ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණු අතර තැන්පතු සහ ලැබිය යුතු සතිපොළ ගාස්තු රු.134,915ක් වැඩියෙන් දක්වා තිබුණි. | 2023 වර්ෂයේ ගිණුම් සකස් කිරීමේදී නිවැරදි කරන බව. | වටිනාකම් නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ඉ) | ගිණුම් විෂයයන් 04ක සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂ සහ උපයෝගී ලේඛන අනුව ශේෂ අතර රු.5,241,038ක වෙනසක් විය. | 2023 වර්ෂයේ ගිණුම සකස් කිරීමේදී නිවැරදි කරන බව. | වෙනසට හේතු හඳුනාගෙන නිරවුල් කළ යුතු වේ. |

### 1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂයය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතුව රු.80,599,514ක් වූ ගිණුම් විෂයයන් 04ක් තහවුරු කර ගැනිම සඳහා අවශ්‍ය විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් නොකෙරුණි. | 2023 වර්ෂයේ ගිණුම සකස් කිරීමේදී අදාළ විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් කරන බව. | විස්තරාත්මක උපලේඛන සකස් කළ යුතු වේ. |

## 1.7 අනුකූල නොවීම

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 371 (5)ට පටහැනිව 1998 වර්ෂයේදී ලබාදී තිබුණු රු.33,000ක අත්තිකාරමක් පියවා නොතිබුණි. | මුදල ප්‍රතිපූර්ණය කළ නොහැකි බැවින් කපා හැරීමට අනුමැතිය සඳහා පළාත් සභාවට ඉදිරිපත් කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.7,947,409ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.3,730,845ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සභාව විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 753,700 | 1,055365 | 1,118,915 | 360,729 | 848,400 | 874,176 | 753,374 | 421,919 |
| කුලී | 5,165,914 | 3,624,433 | 3,494,522 | 2,443,126 | 6,038,644 | 4,199,004 | 2,240,680 | 3,062,280 |
| බලපත්‍ර ගාස්තු | 1,115,500 | 973,580 | 973,580 | - | 1,077,275 | 892,960 | 898,060 | - |
| වෙනත් ආදායම් | 3,316,542 | 3,316,542 | 1,046,258 | - | 10,688,192 | 1,241,554 | 1,137,727 | 103,827 |
| | 10,351,656 | 8,969,920 | 6,633,275 | 2,803,855 | 18,652,511 | 7,207,694 | 5,029,841 | 3,588,026 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 වර්ෂයේදී සංවර්ධිත ලෙස ගැසට් කළ ප්‍රදේශවලින් වරිපනම් බදු අයකිරීමට 2023 මාර්තු වන විටත් කටයුතු කර නොතිබුණි. | දේපළ තක්සේරු කිරීමට තක්සේරු දෙපාර්තමේන්තු වෙත යොමු කර ඇති බව. | වරිපනම් බදු අයකිරීමට කටයුතු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| | එමෙන්ම, 1983 වර්ෂයේ සිට ගිවිසුම් රහිතව ලබා දී තිබුණු බිම්බදු ඒකක 30ක තක්සේරු ගාස්තු 2010 වර්ෂයෙන් පසුව ප්‍රතිශෝධනය කර නොතිබුණි. | | |
| (ආ) | වෙළඳ බලපත්‍ර ගාස්තු, ව්‍යාපාර බදු හා කර්මාන්ත බදු රු.238,680ක් ද, දැන්වීම් පුවරු ගාස්තු රු.135,145ක් ද, ත්‍රී රෝද රථ සාමාජික ගාස්තු රු.111,000ක් ද, අයකර නොතිබුණි. | ඉන්ධන හා සෞඛ්‍ය අර්බුදය හේතුවෙන් මෙබදු හිඟයක් පවතින බව හා හිඟ දැන්වීම් පුවරු ගාස්තු අයකර ගැනීමට කටයුතු කරන බව. | ආදායම් අප්‍රමාදව අයකරගත යුතු වේ. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කොම්පෝස්ට් අංගනයක් ඉදිකිරීම හා ඊට අවශ්‍ය යන්ත්‍ර මිල දී ගැනීම වෙනුවෙන් 2020 හා 2021 වර්ෂවල දී රු.7,612,713ක් වියදම් දරා තිබුණි. එමෙන්ම, 2022 ජූලි මස පළාත් සභාවෙන් රු.950,000ක් වටිනාකමැති බෙලර් යන්ත්‍රයක් ද ලැබී තිබුණි. එහෙත් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කොම්පෝස්ට් ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කර නොතිබුණි. | විදුලි සම්බන්ධතාවය ලද පසුව ඝන අපද්‍රව්‍ය කළමනාකරණ කටයුතු සිදු කිරීමට නියමිත බව. | විධිමත් කසළ කළමනාකරණ වැඩසටහනක් සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතු වේ. |
| (ආ) | සභා බල ප්‍රදේශය තුළ සමාලෝචිත වර්ෂයේදී අපද්‍රව්‍ය මෙට්‍රික් ටොන් 840ක් පමණ බැහැර කිරීමට සේවකයින් 06 දෙනෙකු හා වාහන 02ක් වෙනුවෙන් රු.3,145,472ක් වැයකර තිබුණ ද, එම අපද්‍රව්‍ය පරිසර හිතකාමීව බැහැරකර නොතිබුණි. | කොම්පෝස්ට් අංගනයේ මූලික අවශ්‍යතා සපුරා ගනිමින් එහි කටයුතු විධිමත් කිරීමට කටයුතු කරන බව. | කසළ කළමනාකරණ වැඩසටහනක් සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතු වේ. |

**3.2 වත්කම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව සතු සුසාන භූමි 49කින් 32ක අයිතිය නිරවුල් කර ගෙන නොතිබුණි. | එම ඉඩම් පවරා ගැනීමේ කටයුතු සිදු කරන බව. | අයිතිය පවරා ගැනීමට කටයුතු කළයුතු වේ. |
| (ආ) | ටිපර් රථයක අලුත්වැඩියා කිරීමට 2020 වර්ෂයේ භාර දී 2021 වර්ෂයේදී අත්තිකාරම් ලෙස රු.437,475ක් ගෙවා තිබුණ ද, 2022 දෙසැම්බර් දක්වාම අලුත්වැඩියාව නිමකර නොතිබුණි. | 2022 නොවැම්බර් 01 දින වාහනය අලුත්වැඩියා කිරීම පිළිබඳව සොයා බැලීමක් සිදු කළ බව. | අලුත්වැඩියා කටයුතු කඩිනම් කළයුතු වේ. |

## 3.3 ප්‍රසම්පාදනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ----------------------- | -------------------------- | ----------- |
| හලර් යන්ත්‍රයක් මිල දී ගැනීමට ආයතන 02කින් මිල ගණන් ලැබී තිබුණ ද, එක් ආයතනයකින් පමණක් මිළ ගණන් ලද බවට සාවද්‍ය ලෙස කරුණු දක්වා තිබුණි. මේ නිසා ඇගැයීමකට ලක්නොවූ ආයතනය විසින් ඉදිරිපත් කළ අවම මිල නොපිළිගැනීම නිසා සභාවට රු.644,400ක් මූල්‍යමය හානියක් සිදු වී තිබුණි. | අවම මිල ඉදිරිපත් කළ ආයතනයේ යන්ත්‍රය පිරිවිතර වලට අනුකූල නොවීම නිසා අනෙක් ආයතනයෙන් යන්ත්‍රය මිලදී ගත් බව. | පිළිතුරු සාවද්‍ය වේ. අලාභය වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකර ගත යුතුවේ. |